# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2084/56 – 2018 අගෝස්තු 16 වැනි බ්‍රහස්පතින්දා – 2018.08.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය*: IR/22/07/2011.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරිය**

131 වන අධිකාරිය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2016.04.07 දිනැති හා අංක 1961/29 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2016.04.05 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් අටාල, අරන්දර, ජී. 148හි පදිංචි ඩී. විමලසේන මයා හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 05, කිරුළ පාර, අංක 200හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2018.02.28 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 අගෝස්තු මස 08 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

1A – G 28311 – 09 (2018/08)
*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/22/07/2011.

## කාර්මික අධිකරණයේ දී ය.

ඩී. විමලසේන මයා, ජී. 148, අරන්දර, අටාල.

නඩු අංකය: ඒ/3641

ඉල්ලුම්කරු
එරෙහිව

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, 200, කිරුළ පාර, කොළඹ 05.

වග උත්තරකරු

යන දෙපාර්ශ්වය අතර පැවති කාර්මික ආරවුල

## සම්බන්ධ ප්‍රදානයයි

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා ගරු අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න මැතිතුමා වෙත පැවරී ඇති බලතල අනුව වර්ෂ 1957 අංක 14 සහ 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව එකී ආරවුල බේරුම්කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් 2016.04.05 දිනැති නියෝගයෙන් මා පත්කොට මා වෙත යොමු කොට ඇත.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර කාර්මික ආරාවුලට හේතුවී පැවති කරුණ වූයේ : –

"01. ඩී. විමලසේන මහතාට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් 2002.01.01 දින ලබා දුන් උසස්වීමට අනුව හිඟ වැටුප් නොගෙවීම යුක්තිසහගත ද, එසේ නොවන්නේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේ ද?

02. ඩී. විමලසේන මහතා වෙත 2002.09.18 දින හා 2002.10.21 දින අවස්ථා දෙකක දී ප්‍රදනය කළ වැටුප් වර්ධක මුලින් ලබා දී පසුව 2004/04 දරන චක්‍රලේඛය මගින් අහෝසි කර ආපසු අය කර ගැනීම යුක්තිසහගත ද, එසේ නොවන්නේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේ ද?"

දෙපාර්ශ්වය විසින් තම තමන්ගේ ප්‍රකාශයෙන් ගොනු කරනු ලැබීමෙන් පසුව වර්ෂ 2016 ක් වූ සැප්තැම්බර් මස 28 වන දින කැඳවනු ලැබූ අවස්ථාවල දී සමථයක් ඇති බවට දෙපාර්ශ්වයම විසින් දැනුම් දෙන ලදින් සමථය වාර්ථා කරන ලදී.

ඒ අනුව වැටුප් වර්ධක දීමනාවන්ගේ මුළු එකතුව රු. 37,400ක් ද 2002.07.01 දිනට ලබා දුන් වැටුප් සංශෝධනය 2002.01.01 දිනට පෙර දාතම් කිරීම වෙනුවෙන් රු. 17,500ක හිඟ මුදලක් ද වශයෙන් රු. 54,900ක මුදලක් පූර්ණ හා අවසානාත්මක සමථයක් වශයෙන් ලබා ගෙන පාර්ශ්වයන් අතර වූ කාර්මික ආරවුල සමථ කොට ගොනුවේ අත්සන් තබන ලදී. ඒ ආකාරයෙන් මෙම කාර්මික ආරවුල අවසන් වීම සාධාරණ හා යුක්තිසහගත බැවින් සමථයකට පත් කරමි.

මෙයට,
එස්. ලොකුබෝගහවත්ත,
බේරුම්කරු.

.

2018 පෙබරවාරි මස 28 වැනි දින.

08 - 1111

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.